# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,888 — 1970 ජනවාරි 9 වැනි සිකුරාද — 1970.1.9

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 27 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 56 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 33 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 33 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 55 | විවිධ දැන්වීම් ... ... ... ... | 57 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි. යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---


27—බී 69549—15,721 (12/69)

(ආ) (i) කිරි පට්ටි පාලනය/පාලන කාර්මික විද්‍යාව පිළිබඳ පළපුරුද්දක් සහිත පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය හෝ පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක්

හෝ

(ii) කිරි පට්ටි පාලනය පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ආයතනයක අඩුම වශයෙන් අධ්‍යයන වර්ෂ 3කට නොඅඩු කාලයක් තුළ හදාරණ ලද පාඨමාලාවක් ඇවෑමෙන් පිරිනැමෙන ඩිප්ලෝමා සහතික පත්‍රයක් ලබා තිබීම.

(ඇ) කුලියාපිටිය කණිෂ්ඨ විශ්වවිද්‍යාලයේ තනතුරු සඳහා අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළදී සිංහල පිළිබඳ නියමිත තත්ත්වයක වැඩිපුර ප්‍රවීණතාවයක් ලබා ගන්නා ලෙස පත්වීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකිය.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපතෘත පාසල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(ආ) උපාධිය සහ උසස් ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඉ) සිංහලෙන් සමත් වූ උසස්ම විභාගයේ සහතික පත්‍රය.

**සංලක්ෂ්‍යය :** (1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නො හැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවා නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට, ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපැද්දේ නමුදු, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජනවාරි මස 2 වැනිදා,
කොළඹ 1, ගාළු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

1–228/1—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

අංකය: ඒඒ. 106/එක්ස්. 2188/69.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### පර්යේෂණ නිලධාරි තනතුරු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 පෙබරවාරි මස 9 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 පෙබරවාරි මස 16 වැනිදා.

**සටහන් :—**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**— මෙම තනතුරු සථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

3. **වැටුප්.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමාණය මෙසේ ය :—

රුපියල් 11,520 හා රුපියල් 14,400 පෙර කාර්යක්ෂමතා කඩඉම් ද සහිතව වර්ෂයකට රු. 6,720—12×360 සහ 11×480—16,320 දක්වා (1969.10.1 දිනට පෙර පැවති අනුරූප මූලික වැටුප් ක්‍රමය නම් වර්ෂයකට රු. 4,080—360×12 සහ 480×10—13,200).

**සටහන :**

(1) යථෝක්ත වැටුප් පරිමාණයේ රු. 11,040 ඒකාබද්ධ වාර්ෂික වැටුප ඉක්මවා යෑමට පෙර පර්යේෂණ නිලධාරීන් විසින් ඕනෑම පිළිගත් විශ්ව විද්‍යාලයක යටත් පිරිසෙයින් අවුරුද්දක පූර්ණ කාල අධ්‍යයනයකින් පසු පාංශු විද්‍යාව, කෘෂි කර්මික කාර්මික විද්‍යාව, ජල විද්‍යාව, ජල ගර්භ විද්‍යාව සහ ජල ශක්ති විද්‍යාව වැනි විෂයයන ගෙන් ඕනෑම එකක් පිළිබඳව,

(අ) ආචාර්ය උපාධියක්, හෝ

(ආ) විද්‍යාපති උපාධියක් නොඑසේ නම් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ගත යුතුය.

(ii) ඉහත දක්වා ඇති පශ්චාත් උපාධි සුදුසුකමක් සහිතව සේවයට බැඳෙන තැනැත්තෝ ඉහත සඳහන් වැටුප් පරිමාණයේ රු. 7,800 වාර්ෂික ඒකාබද්ධ වැටුප මත තබනු ලැබීමට සුදුසු වෙති.

**4. අවශ්‍ය සුදුසුකම්.**— සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුතු බව,

(බී) 1970. 2. 9 දිනට වයස අවුරුදු 30ට නොවැඩි බව (මෙම වයස් සීමාව දැනටමත් රජයේ සේවයේ නියුක්ත වුවන් කෙරෙහි බල නොපානු ඇත.) අවශ්‍ය පශ්චාත් උපාධි සුදුසුකම් ඇති අයදුම්කරුවන් වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

(සී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණිතය, භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් පිළිබඳව ලබාගත් පළමුවැනි හෝ දෙවැනි පෙළ, ගෞරව උපාධියක් දරන්නකු බව හෝ,

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයයකින් ලබාගත් ඉංජිනේරු උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් හෝ ඇති බව, හෝ

(iii) යටකී විෂයයන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ සහිත පිළිගත් විශ්ව විද්‍යාලයක සාමාන්‍ය විද්‍යා උපාධියක් ඇති, පර්යේෂණ සහකාරයින් ලෙස අවුරුදු දහයක සේවයක් ඇති දෙපාර්තමේන්තුමය නිලධාරීන්ටද මෙම තනතුරු සඳහා ඉදිරිපත් විය හැක.

**5.** පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු.** (i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නාමට පුද්ගලිකව නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට, ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජනවාරි මස 2 වැනිදා,
කොළඹ 1, ගාළු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
නැ. පෙ. 500.

1–228/2—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 90/එක්ස්. 2189/69.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල II වෙනි ශ්‍රේණියේ සමාජ අධ්‍යාපනය පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල සමාජ අධ්‍යාපනය පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළයුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

1. මෙරට අයදුම්පත්—1970 පෙබරවාරි මස 9 වැනිදා.

2. පිටරට අයදුම්පත්—1970 පෙබරවාරි මස 16 වැනිදා.

**සටහන් :—**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයක් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයා ගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන් ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

**2. වැටුප් දීමනා හා සේවා කොන්දේසි :**

(1) මෙම තනතුර සඳහා රු. 6,720—12×360—11,040 වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් නියමිතය.

(2) තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුය. දැනට ඇරැඹුණු ඇත්තේ ගාල්ල, දෙහිවල, කුලියාපිටිය, කෑගල්ල, පොල්ගොල්ල සහ පලාලි කණිෂ්ඨ විශ්වවිද්‍යාලවලය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් මේ විශ්ව විද්‍යාලවලට පත් කරනු ලැබේ.

**3. බඳවා ගැනීමේ කොන්දේසි :—**

(1) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

(2) මෙම පත්වීම ප්‍රථමකොට අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වනු ඇත.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින් ම ඔහු/ඇ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1970.2.9 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු බවට හා අවුරුදු 40 ට නොවැඩි බවට, (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරන අයගේ අයදුම්පත් උපරිම වයස් සීමාව ගැන නොතකා සලකා බලනු ඇත.)

(ආ) 1. පහත දැක්වෙන (i) හා (ii) උපබන්ධ යටතේ සඳහන් විෂයයන්ගෙන් (i) උපබන්ධය යටතේ ඇති විෂයයන්ගෙන් යටත් පිරිසෙයින් එක විෂයයක් වත් ඇතිව, විෂයයන් 2 ක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක්,

(i) ආර්ථික විද්‍යාව, අධ්‍යාපන විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, දර්ශන විද්‍යාව.

(ii) භූගෝල විද්‍යාව, ඉතිහාසය.

හා

2. විශ්ව විද්‍යාලයක තුන් අවුරුද්දක හෝ ගුරු විද්‍යාලයක හා/හෝ ද්විතීයික අධ්‍යාපන මට්ටමේ පස් අවුරුද්දක ඉගැන්වීමේ පළපුරුද්දක්.

(ඇ) දෙහිවල, ගාල්ල, කෑගල්ල, පොල්ගොල්ල හා කුලියාපිටිය කණිෂ්ඨ විශ්වවිද්‍යාලවල තනතුරු සඳහා අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. පලාලි කණිෂ්ඨ විශ්වවිද්‍යාලයේ තනතුරු සඳහා අයදුම්කරුවන්ට දෙමළෙන් වැඩ කිරීමට මනා දැනීමක් තිබීම අවශ්‍ය ය. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළදී සිංහල හෝ දෙමළ (අදාල විය හැකි පරිදි) පිළිබඳ නියමිත තත්ත්වයක වැඩිපුර ප්‍රවීණතාවයක් ලබා ගන්නා ලෙස පත්වීම් සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකි ය.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපෙක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතිස්ම සහතික හෝ උපකෘත පාසල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරණ ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(ආ) උපාධිය සහ උසස් ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්,, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර

(ඉ) සිංහලෙන්/දෙමළෙන් සමත් වූ උසස් ම විභාගයේ සහතික පත්‍රය.

සංලක්ෂ්‍යය :

(1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවා නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතු ය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද (" ආ " සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකි ය.

7. අයදුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද (" අ " සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට, ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970, ජනවාරි මස 2 වැනිදා,
කොළඹ 1, ගාළු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
නැ. පෙ. 500.

1–228/3—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 91/එක්ස්. 2190/69.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල II වෙනි ශ්‍රේණියේ පුස්තකාල විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල පුස්තකාල විද්‍යාව පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළයුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

1. මෙරට අයදුම්පත්—1970 පෙබරවාරි මස 9 වැනිදා.

2. පිටරට අයදුම්පත්—1970 පෙබරවාරි මස 16 වැනිදා.

සටහන් :—

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමානයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයක් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයා ගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන් ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

2. වැටුප් දීමනා හා සේවා කොන්දේසි :

(1) මෙම තනතුර සඳහා රු. 6,720—12×360—11,040 වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් නියමිතය.

(2) තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුය. දැනට ආබෑර්තු ඇත්තේ දෙහිවල සහ පලාලි කණිෂ්ඨ විශ්වවිද්‍යාලවල ය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් මේ විශ්ව විද්‍යාලවලට පත් කරනු ලැබේ.

3. බඳවා ගැනීමේ කොන්දේසි :—

(1) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

(2) මෙම පත්වීම ප්‍රථමකොට අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වනු ඇත.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකු විසින් ම ඔහු/ඈ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1970.2.9 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු බවට හා අවුරුදු 40 ට නොවැඩි බවට, (දැනටමත් රජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන අයගේ අයදුම්පත් උපරිම වයස් සීමාව ගැන නොතකා සලකා බලනු ඇත.)

(ආ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ සම තත්ත්වයේ ආයතනයක එක් විද්‍යාලයීය වර්ෂයකට නොඅඩු කාලයක් පුස්තකාල විද්‍යාව පිළිබඳ පාඨමාලාවක් හදාරා ලබාගත් සුදුසුකම

(iii) අ. පො. ස. (සා. පෙ.) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ ඊට සමාන විභාගයකදී සිංහල/දෙමළ භාෂාව/ස හිත්‍යයෙන් සම්මාන සාමාර්ථයක් ලබාතිබීම හෝ ඊට උසස් විභාගයකදී සිංහල/දෙමළ භාෂාව/සාහිත්‍ය යෙන් සමාර්ථයක් ලබා තිබීම (මෙය ඉංග්‍රීසියෙන්) උපාධිය ලබාගත් අයට සීමාවේ.)

නැතහොත්

අ. පො. ස. (සා. පෙ.) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ ඊට සමාන විභාගයකදී සිංහල/දෙමළ භාෂාව/ස හිත්‍යයෙන් සම්මාන සාමාර්ථයක් ලබාතිබීම හෝ පත්‍ර හෝ ඊට සමාන විභ ගයකදී ඉංග්‍රීසි භාෂාව/ ඊට උසස් විභාගයකදී ඉංග්‍රීසි භාෂාව/සාහිත්‍යයෙන් සාමාර්ථයක් ලබා තිබීම (මෙය සිංහලෙන්/දෙමළෙන් උපාධිය ලබාගත් අයට සීමාවේ.)

(iv) පුස්තකාල කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති අයට වැඩි සැලකිලි දක්වනු ලැබේ.

(ඇ) දෙහිවල හා පොල්ගොල්ල කණිෂ්ඨ විශ්වවිද්‍යාලවල තනතුරු සඳහා අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. පළාලි කණිෂ්ඨ විශ්ව විද්‍යාලයේ තනතුරු සඳහා අයදුම්කරුවන්ට දෙමළෙන් වැඩ කිරීමට මනා දැනීමක් තිබීම අවශ්‍ය ය. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළදී සිංහල හෝ දෙමළ (අදාල විය හැකි පරිදි) පිළිබඳ නියමිත තත්වයක වැඩිපුර ප්‍රවීණතාවයක් ලබා ගන්නා ලෙස පත් වීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකි ය.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාසල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරණ ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(ආ) උපාධිය සහ උසස් ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයා ගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඉ) සිංහලෙන්/දෙමළෙන් සමත් වූ උසස් ම විභාගයේ සහතික පත්‍රය.

සංලක්ෂ්‍යය :

(1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවා නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතු ය. ඉල්ලුම් පත්‍ර පෝර්ම සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකි ය.

7. අයදුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්ත මේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට, ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970, ජනවාරි මස 2 වැනිදා,
කොළඹ 1, ගාළු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

1–228/4—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## ලංකා යුධ හමුදාව—සෙසු නිල පත්වීම්

ඉහත සඳහන් ශීර්ෂය යටතේ අංක 14,884 හා 1969 දෙසැම්බර් මස 12 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයෙහි පළවූ නිවේදනය මෙහි පහත දක්වෙන පරිදි මෙසින් සංශෝධනය කෙරේ :—

1. ගැසට් පත්‍රයේ 1943 පිටුවෙහි ආරම්භයෙහිම දක්වා ඇති ඡේදයට යොදා ඇති අංකය වන "5" ලොප්කර ඒ වෙනුවට "6" යෙදීම.

2. 2(ආ) ඡේදයේ ඇති විස්තරය ලොප්කර ඒ වෙනුවට—
"1970.2.14 දිනට වයස අවුරුදු 18 ට නොඅඩුවද වයස අවුරුදු 40 ට නොවැඩිවද සිටිය යුතුය" යන්න යෙදීම.

3. 6(ආ) ඡේදයේ 3 වැනි පේලිය ලොප්කර ඒ වෙනුවට—
"ඉල්ලුම් පත්‍ර 1970. 2. 14 සවස 4.30 ට පෙර යුද හමුද මූලස්ථානයට ලැබිය යුතුය" යන්න යෙදීම.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
මාණ්ඩලික ප්‍රධාන,
යුධ හමුදාධිපති වෙනුවට.

යුධ හමුද මූලස්ථානය,
කොළඹ, 1970 ජනවාරි මස 3.

1–307—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### සම්බන්ධතා නිලධාරි තනතුර

1969.12.5 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළවූ 69.11.22 වැනි දින දරණ දැන්වීම සම්බන්ධවයි. ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 1970.1.23 දින දක්වා දීර්ඝ කර ඇත.

අ. ම. මු. සහබදීන්,
සමාජ සේවා අධ්‍යක්ෂ.

1969 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 3, තැ.පෙ. 577,
බාලදක්ෂ මාවත, ගාලුමුවදෙර,
සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

1–233—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

**රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා සිංහල ප්‍රවීණතා පරීක්ෂණ— මාර්තු 1970**

පූර්වෝක්ත පරීක්ෂණ 1970 මාර්තු 14 සහ 21 වැනි දිනයන් හි පැවැත්වේ. මෙම පරීක්ෂණවලට පෙනී සිටින නිලධාරීන් තමන් ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ/ශාඛා ප්‍රධානීන් ගේ මාර්ගයෙන් 1970 පෙබරවාරි මස 3 වැනි දිනට ප්‍රථම මා වෙත එවිය යුතුයි.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

1970 ජනවාරි මස 2 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේදීය.

1–313—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## ඒකාබද්ධ රේගු සේවය

1969 දෙසැම්බර මස 12 වන දින අංක 14,884 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටස (II) වැනි ඡේදයේ (පළකිරීම්) 1952 පිටේ ඇති නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත.

"6. **යෝග්‍යතාවය :—**

(iii) අපේක්ෂකයන්—

(අ) අංක ගණිතය හෝ ගණිතය හා ඉංග්‍රීසි භාෂාවෙන් පොදු අධ්‍යයන සහතික (සාමාන්‍ය පෙළ) විභාගයට නොඅඩු තත්ත්වයේ සාමාර්ථයක් ලබා සිටිය යුතු හා

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යෙන් හෝ ඊට උසස් විභාගයකින් එකම අවස්ථා වක ඒකම විභාගයෙන් විෂයයන් තුනකින් සාමාර්ථය ලබා සිටිය යුත්තාහ.

(iv) සෑම අපේක්ෂකයකුම 1970. 1. 28 දිනට තමා වයස අවුරුදු 17 ට එළඹ ඇති බවට හා 1970. 1. 16 දිනට වයස අවුරුදු 24 නොඉක්මවා ඇති බව සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

7. **අයදුම්පත් :—**

(ii) අයදුම් පත 1970 ජනවාරි මස 28 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් කොළඹ 1, තැ. පෙ. 518, ප්‍රධාන රේගු අයකැමි වෙත ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල දැනට සේවයෙහි යෙදී සිටින අපෙක්ෂකයින් විසින් එවනු ලබන අයදුම් පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු වල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. 1970.1.28 දිනට හෝ ඊට ප්‍රථම යෙන් හෝ ප්‍රධාන රේගු අයකැමි වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමකුත් සමග ස්වකීය අයදුම් පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන්ගේ ඉල්ලනු ලැබේ.

ප්‍රධාන රේගු අයකැමි.

1970 ජනවාරි මස 4 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1–254—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## යුද හමුදා මූලස්ථානය—කොළඹ

1969–70 මුදල් වර්ෂය තුල මෙහි පහත සඳහන් සේවාවන් සැපයීම පිළිබඳව යුද හමුදා මූලස්ථානය විසින් කැඳවන ලද ටෙන්ඩර් පත් සඳහා යුද හමුද, ටෙන්ඩර් මණ්ඩලය විසින් ගන්නා ලද අවසාන තීරණය මෙය වේ. සැපයීම් ඉදිරියෙන් දක්වා ඇති අංකය මගින් පෙන්වනුයේ ඒ ඒ සේවාවන් පිළිබඳව ලැබුණ ටෙන්ඩර් පත් ගණනය.

| ලැබුණ ටෙන්ඩර් පත් ගණන | සේවාව | ස්ථානය | පිළිගන්නා ලද ටෙන්ඩර්කරු |
|---|---|---|---|
| 8 ... | යුද හමුදාවට, රාජකීය ලංකා නාවික හමුදාවට, රාජකීය ලංකා ගුවන් හමුදාවට එළවලු, පලතුරු, පොල් සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය සැපයීම | කොළඹ | ... එස්. බී. එන්. ගුණරත්න මහත්මිය, 212/53, ගැස් කර්මාන්ත වීදිය, කොළඹ 11 |
| 5 ... | එම ... | දියතලාව | ... එස්. එම්. ඒ. අසීස් මයා., මස් වෙළඳ සැල දියතලාව |
| 3 ... | යුද හමුදාවට, රාජකීය ලංකා නාවික හමුදාවට, රාජකීය ලංකා ගුවන් හමුදාවට අලුත් මාලු වර්ග සැපයීම | දියතලාව | ... වික්‍රමරත්නස් මහත්වරු, 212/49ඊ, ගැස් කර්මාන්ත විදිය, කොළඹ 11 |
| 3 ... | යුද හමුදාවට, රාජකීය ලංකා නාවික හමුදාවට, රාජකීය ලංකා ගුවන් හමුදාවට මස් වර්ග සැපයීම | කොළඹ | ... එම්. ඩී. ආර්. ඇලෙක්සැන්ඩර් මයා., අංක 36, පාලිත පෙදෙස, කොළඹ 9 |
| 2 ... | එම ... | දියතලාව | ... එස්. එම්. ඒ. අසීස් මයා., පෙරකී අය |
| 7 ... | යුද හමුදාවට පමණක්, එළවලු, පලතුරු, පොල් සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය සැපයීම | පනාගොඩ | ... වික්‍රමරත්නස් මහත්වරු, පෙරකී අය |
| 5 ... | යුද හමුදාවට පමණක් අලුත් මාලු වර්ග සැපයීම ... ... | පනාගොඩ | ... වික්‍රමරත්නස් මහත්වරු, පෙරකී අය |
| 4 ... | යුද හමුදාවට පමණක් මස් වර්ග සැපයීම ... ... | පනාගොඩ | ... එම්. වයි. එස්. මොහිදීන් මයා., අංක 62/1, ආරාමය පාර, දෙමටගොඩ, කොළඹ 9 |
| 6 ... | යුද හමුදාවට පමණක් එළවලු, පලතුරු, පොල් සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය සැපයීම | කටුකුරුන්ද | ... එස්. බී. එන්. ගුණරත්න මිය., පෙරකී අය |
| 4 ... | යුද හමුදාවට පමණක් අලුත් මාලු වර්ග සැපයීම ... ... | කටුකුරුන්ද | ... වික්‍රමරත්නස් මහත්වරු, පෙරකී අය |
| 2 ... | යුද හමුදාවට පමණක් මස් වර්ග සැපයීම ... ... | කටුකුරුන්ද | ... වික්‍රමරත්නස් මහත්වරු, පෙරකී අය |
| 3 ... | යුද හමුදාවට පමණක් එළවලු, පලතුරු, පොල් සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය හා මස් වර්ග සැපයීම | තල්ලාඩි | ... වික්‍රමරත්නස් මහත්වරු, පෙරකී අය |
| 3 ... | යුද හමුදාවට පමණක් එළවලු, පලතුරු, පොල් සහ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය හා මස් වර්ග සැපයීම | තොඩ්ඩවෙලි | ... වික්‍රමරත්නස් මහත්වරු, පෙරකී අය |
| 4 ... | යුද හමුදාවට පමණක් අලුත් මාලු වර්ග සැපයීම ... ... | තල්ලාඩි | ... ඒ. එල්. එම්. හුසේන් මයා., ඒ. පී. පාර, ඉරක්කුලම්පිඩි |
| 4 ... | යුද හමුදාවට පමණක් අලුත් මාලු වර්ග සැපයීම ... ... | තොඩ්ඩවෙලි | ... වික්‍රමරත්නස් මහත්වරු, පෙරකී අය |

| ලැබුණ ටෙන්ඩර්පත් ගණන | සේවාව | ස්ථානය | පිළිගත්නාලද ටෙන්ඩර්කරු |
|---|---|---|---|
| 5 ... | යුද හමුදාවට පමණක් එළවලු, පලතුරු, පොල්, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අලුත් මාලු වර්ග සැපයීම | කන්තලේ | ... වික්‍රමරත්නස් මහත්වරු, පෙරකී අය |
| 6 ... | යුද හමුදාවට පමණක් එළවලු, පලතුරු, පොල්, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අලුත් මාලු වර්ග සැපයීම | අම්පාරේ | ... එස්. පොන්නම්පලම් මයා., අංක 3, රෝහල් පාර, අම්පාරේ |
| 3 ... | යුද හමුදාවට පමණක් එළවලු, පලතුරු, පොල්, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අලුත් මාලු වර්ග සැපයීම | සීලාවතුරේ | ... එස්. එස්. සෙල්ලදොරේ මයා., පළමුවෙනි මරදාන, කොළඹ 10 |
| 5 ... | යුද හමුදාවට පමණක් එළවලු, පලතුරු, පොල්, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අලුත් මාලු වර්ග සැපයීම | අයියකච්චී | ... ඒ. විජේරත්නම් මයා., "මහේශ්වරි" විලාස්. කිලිනොච්චි |
| 5 ... | යුද හමුදාවට පමණක් එළවලු, පලතුරු, පොල්, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අලුත් මාලු වර්ග සැපයීම | යාපනය | ... එස්. තමෝතරම්පිල්ලෙයි මයා., ග්‍රෑන්ඩ් බසාර්, එළවලු මාර්කට්, යාපනය |
| 4 ... | යුද හමුදාවට පමණක් එළවලු, පලතුරු, පොල්, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අලුත් මාලු වර්ග සැපයීම | වෙම්පන්කුන්ඩු | ... එස්. තමෝතරම්පිල්ලෙයි මයා., පෙරකී අය |
| 4 ... | යුද හමුදාවට පමණක් එළවලු, පලතුරු, පොල්, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අලුත් මාලු වර්ග සැපයීම | මුලතිව් | ... එස්. තමෝදරම්පිල්ලෙයි මයා., පෙරකී අය |
| 3 ... | යුද හමුදාවට පමණක් පලාපු දර සැපයීම ... | ... මන්නාරම | ... වික්‍රමරත්නස් මහත්වරු, පෙරකී අය |
| 3 ... | එම | ... සීලාවතුරේ | ... වික්‍රමරත්නස් මහත්වරු, පෙරකී අය |
| 4 ... | එම | ... මුලතිව් | ... වික්‍රමරත්නස් මහත්වරු, පෙරකී අය |
| 5 ... | එම | ... වෙම්පන්කුන්ඩු | ... එස්. එස්. සෙල්ලදොරේ මයා., පෙරකී අය |
| 4 ... | එම | ... යාපනය | ... එස්. සුබ්‍රමනියම් මයා, නුවර පාර, පලෙයි |
| 5 ... | එම | ... අයියකච්චී | ... එස්. සුබ්‍රමනියම් මයා., පෙරකී අය |
| 6 ... | යුද හමුදාවට පමණක් රජක සේවය සැපයීම ... | ... කොළඹ | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., බ්‍රෑන්ඩියවත්ත, වැල්ලම්පිටිය |
| 4 ... | එම | ... පනාගොඩ | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., පෙරකී අය |
| 6 ... | එම | ... දියතලාව | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා, පෙරකී අය |
| 6 ... | එම | ... ත්‍රිකුණාමළය | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., පෙරකී අය |
| 4 ... | එම | ... යාපනය | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., පෙරකී අය |
| 4 ... | එම | ... මුලතිව් | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., පෙරකී අය |
| 4 ... | එම | ... සීලාවතුරේ | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., පෙරකී අය |
| 4 ... | එම | ... අම්පාරේ | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., පෙරකී අය |
| 4 ... | එම | ... අයියකච්චී | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., පෙරකී අය |
| 4 ... | එම | ... උඩවළවේ | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., පෙරකී අය |
| 4 ... | එම | ... වෙම්පන්කුන්ඩු | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., පෙරකී අය |
| 5 ... | එම | ... පදවිය | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., පෙරකී අය |
| 4 ... | එම | ... මන්නාරම | ... ඩබ්. ඩී. ප්‍රනාන්දු මයා., පෙරකී අය |
| 7 ... | එම | ... කටුකුරුන්ද | ... ආර්. ඩී. ප්‍රනාන්දු මයා., අංක 12/3, සාලමුල්ල පාර, වැල්ලම්පිටිය |
| 5 ... | එම | ... කන්තලේ | ... වියුඩර් වර්නසූරිය මයා., අංක 84/6, නාගරික නිවාසය, වැකන්ද පාර, කොළඹ 2 |
| 2 ... | යුද හමුදාවට, රාජකීය ලංකා නාවික හමුදාවට සහ රාජකීය ලංකා ගුවන් හමුදාවට කම්කරු හා කසළ ශෝධකයින් සැපයීම | දියතලාව | ... ආමි ඇන්ඩ් නේවි ස්ටෝර්ස්, දියතලාව |

ඉහත ප්‍රකාර පිරිනමන ලද කොන්ත්‍රාත් සම්බන්ධ මිළ ගණන් කොළඹ, බාලදක්ෂ මාවතේ යුද හමුදා මූලස්ථානයට පැමිණ දැනගැනීමට හැකිබව මෙයින් දන්වමි.

1969 දෙසැම්බර් මස 27 වැනි දින,
යුද හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ දී ය.

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද හමුදා ආඥාපති.

1–219—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418. කොළඹ 1.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන් හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය. |
|---|---|
| 1. මෙරට සෑදූ පින්තල යතුරු තහඩු සැපයීම ... | 1970.2.10 |
| 2. මෙරට සෑදූ වානේ සේප්පු සැපයීම ... | 1970.2.10 |
| 3. කුණාටු ලන්තෑරුම් සැපයීම ... | 1970.3.3 |
| 4. පිටපත් කිරීමේ ද්‍රව්‍ය සැපයීම ... | 1970.3.3 |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970.1.9 දින,
කොළඹදීය.

1–227—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1970 ජනවාරි මස 31 වෙනි සෙනසුරාදා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට ආර්ටිකියුලේටඩ් වගීයේ ඉදිරියෙන් පටවන ඩීසල් රථයක් සපයා භාරදීම සඳහා ප්‍රාදේශීය නියෝජිතයින් ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1970 ජනවාරි මස 31 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. මෙම සැපයීම තමන්ගේ ගබඩාවෙන් වහාම හෝ වැඩිම ගණනේ මාස දෙකක් ඇතුළතදී හෝ සැපයිය යුතුය.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර්, දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1970 ජනවාරි මස 29 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1970.1.9.

1–240—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## දිසාපති කාර්යාලය—මොනරාගල

### ජීප් රථයක් විකිණීම සඳහා මිළ ගණන් කැඳවීම

ලියා පදිංචි අ ක 1 ශ්‍රී 9350 දරණ 'විලීස්' වර්ගයේ ජීප් රථය මිළයට ගෙන ඉවත ගෙන යාම සඳහා, මිළ ගණන් අඩංගු ටෙන්ඩර් පත්‍ර මොණරාගල දිසාපති විසින් 1970. 1. 27 වැනි දින පූ. භා. 11.30 වන තෙක් භාර ගනු ලැබේ.

2. මොණරාගල දිසාපති කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති වල මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය. අනුමත ආකෘති වල නොවන මිළ ගණන් සලකා බලනු නොලැබේ. ආකෘති පත්‍ර සඳහා මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල හොත් පමණක් 1970. 1. 26 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. මිළ ගණන් පිළිගත් බව දැනුම් දීමෙන් පසු දින පහක් (5) ඇතුළත රථය සඳහා ඉදිරිපත් කරන ලද සම්පූර්ණ වටිනාකම තැන්පත් කිරීමට නොහැකිවූ හෝ පැහැර හරින ලද හෝ අයගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කරනු ලැබේ.

4. සාර්ථක වූ ටෙන්ඩර්කරු, වටිනාකම තැන්පත් කරනු ලබන දිනයේම රථය ගෙන යා යුතුය.

5. කිසිම විමසීමක් නොමැතිව මිළ ගණන් එකක් හෝ සියල්ල ප්‍රතික්ෂේප කිරීමට මොණරාගල දිසාපති ට සම්පූර්ණයෙන්ම අයිතිය ඇත.

6. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම බහා එවන කවරය වම් පස උඩ කෙළවරේ "ජීප් රියක් මිළයට ගැනීම සඳහා මිළ ගණන්" යනු වෙන් සඳහන් කර ලියා පදිංචි තැපැලෙන් එවීම හෝ මොණරාගල දිසාපති කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ කළ හැකිය.

7. මොණරාගල දිසාපති කාර්යාලයේ දී කාර්යාලීය වේලාවන් ඇතුලත මෙම ජීප් රථය පරීක්ෂා කර බැලිය හැක.

8. 1970. 1. 28 වැනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් විවෘත කරන අතර, එම අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

9. තවද, වැඩි විස්තර කාර්යාලීය වේලාවන් ඇතුළත මොණරාගල දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැක.

පී. ජී. පුංචිහේවා,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1969. 12. 21 වැනි දින,
මොණරාගල දිසාපති කාර්යාලයේ දීය.

1–246—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහනුවර උප කොටස

1969.12.19 දින රජයේ ගැසට් පත්‍රයේ පලවූ දැන්වීම හා සම්බන්ධයි.

යෝජිත පල්ලෙකැලේ නව නගරයෙහි ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සඳහා ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය 1970.1.23 දක්වා දිගු කරන ලදී. මේ අනුව ටෙන්ඩර් පත් නිකුත් කිරීම 1970.1.21 දක්වා කල් දී ඇත.

ඒ. ජී. ජේ. ද පින්ටෝ,
මහනුවර වාරිමාර්ග ඉංජිනේරු,

වාරිමාර්ග කාර්යාලය,
කුණ්ඩසාලේ,
69.12.26 දින දීය.

1–234—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### අනුරාධපුර උප කොටස

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කටියාව නියමු (පයිලට්) ඇල වැඩි දියුණු කිරීම සඳහා අනුරාධපුර, උතුරු මැද කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970. 1. 24 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එදින එවේලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 38,500 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1970. 1. 9 වෙනි දින සිට 1970 1. 20 වෙනි දින දක්වා කායාලීය වේලාවන් තුළදී අනුරාධපුර, මහකනදරාව, පදවිය, රාජාංගන වාරිමාර්ග ඉංජිනේරු කායාලීය වලින් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලබාදිය යුතුද? නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර මෙම වැඩය සඳහා රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් කායාලීලවල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

5. මෙම වැඩය ගැන සියළුම විස්තර, සැලසුම් ආදිය කායාලීය වේලාවන් තුළදී අනුරාධපුර වාරිමාර්ග කායාලීයෙන් ලබාගත හැක.

ඩබ්ලිව්. ඇස්. සබාරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අනුරාධපුර උප කොටස.

1969. 12. 27 වෙනි දින,
අනුරාධපුර වාරිමාර්ග කායාලීයේ දීය.

1–237—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මොණරාගල උප කොටස

සිවුල්වැව ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව 1969. 11. 28 වන දින අංක 14,882 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය සම්බන්ධවයි. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1970.1.24 වෙනි දින පෙරවරු 10 තෙක් දීර්ග කරනු ලැබේ. 1970.1.20 වෙනි දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

ඒ. එෆ්. මහගමගේ,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මොණරාගල, උ. කො.

1969 දෙසැම්බර් මස 27 වන දින,
මොණරාගල වාරිමාර්ග කාර්යාලයේ දීය.

1–236—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මාතර උප කොට්ඨාශය

1969-70 මුදල් වර්ෂය සඳහා මාතර උප කොටසට බඩු ආදිය ප්‍රවාහණය කිරීම පිණිස දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 පෙබරවාරි මස 3 වැනි දින පෙරවරු 10 තෙක් ටෙන්ඩර් භාර ගෙන එවලේම විවෘත කරනු ලැබේ.

2. මෙම ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක්කේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණි.

3. මෙම ටෙන්ඩර් පෝර්ම මාතර, ගාල්ල, හම්බන්තොට හා තිස්සමහාරාමය වාරිමාර්ග කාර්යාලයන් ගෙන් රාජකාරී වේලාවන් හිදී 1970. 1. 31 වෙනි දින දවල් 12 වන තෙක් ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට ඉදිරිපත් වන අයදුම්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත ඉදිරිපත් කළ යුතු අතර, එදින වන විට දෙපාර්තමේන්තුවේ භාරගෙන තිබෙන වැඩවල වටිනාකම ගැන විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මාතර, ගාල්ල, හම්බන්තොට සහ තිස්සමහාරාමය යන වාරිමාර්ග කාර්යාල වල හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරණු ලබන්නේ මෙවැනි වැඩ සඳහා අවශ්‍ය වාහන සහ කම්කරුවන් යෙදවිය හැකි බව ඔප්පු කිරීමට හැකියාවක් ඇති අයට පමණි.

5. මෙයට අදාල අනිකුත් විස්තර කාර්යාල වේලාවන් තුළදී මාතර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිය.

එච්. සී. සී. ගුණවර්ධන,
වාරිමාර්ග ඉංජිනේරු,
මාතර, උප කොට්ඨාශය.

1969 දෙසැම්බර් මස 20 වැනි දින,
මාතර වාරිමාර්ග කාර්යාලයේ දීය.

1–235—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අම්පාර උප කොටස

පහත දක්වෙන වැඩ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයදුම්පත් 1970 පෙබරවාරි මස 1 වෙනි ඉරුදින පෙරවරු 10 දක්වා මඩකළපුව නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදු කෙරේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩ ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන් වලට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිති වලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

| ටෙන්ඩර් අංකය | වැඩයේ නම | ලියාපදිංචි වූ ගණන | තැන්පත් මුදල |
|---|---|---|---|
| අ/1/69–70 ... | අම්පාර උප කොට්ඨාශයේ ගංභා ප්‍රදේශයේ පරසඩ්ඕඩෙයි අමුණ ඉදිකිරීම ... | රු. 75,000 ... | රු. 100 |

2. 1970 ජනවාරි මස 27 වෙනි අඟහරුවාදා සවස 4 දක්වා අම්පාර කල්මුණ හා වෙන්කල්අඩි උප කොට්ඨාශයන්හි වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගේ කාර්යාලයන්ගෙන් කාර්යාලීය වේලාවන් තුලදී ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කොට එවිය යුතුය. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරිමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි වීමේ පොත් සහ දනට ඔවුන් කරන දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම පිළිබඳ ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරිමට ඉඩ තිබේද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත, ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති නිකුත් කිරිමට පෙර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ඉහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළයුතුව ඇති අතර එසේ නැතහොත් දිසාපති කාර්යාලයක එවැනි තැන්පත් කිරිමක් කල බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. මෙම ටෙන්ඩර් පිළිබඳව වැඩි විස්තර අම්පාර උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුලදී ලබා ගත හැකිය.

එන්. ජී. තාමෝදරම්,
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, නැගෙනහිර කොට්ඨාශය.

1969 දෙසැම්බර් මස 27 වෙනි දින,
ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලය,
මඩකලපුව.

1–231—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මුලතිව් උප කොටස

1969-70 මුදල් වර්ෂය වෙනුවෙන් මුලතිව් උප කොට්ඨාශයේ ගබඩා බඩු ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර් අයදුම්පත් උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 පෙබරවාරි මස 1 වෙනි දින පෙ. ව. 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් කිරීම සඳහා සුදුසු වන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි රු. 25,000 ක් හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වූ, ප්‍රවාහණ කටයුතු සඳහා සෑහෙන ලොරි ප්‍රමාණයක් ඇති කොන්ත්‍රාත්කරුවන්, සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිතින් පමණි.

3. 1970 ජනවාරි මස 12 වෙනි දින සිට 28 වෙනි දින දක්වා කාර්යාලයීය වේලාවන් තුළ පමණක් මුලතිව්, වවුනියාව, වවුනිකුලම්, මන්නාරම හා යාපනය යන උප කොට්ඨාශයන්හි වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලින් ලබාගතහැකි ටෙන්ඩර් පෝර්මවල අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන්, ඔවුන් ටෙන්ඩර් භාර දීම සඳහා සුදුසුද යන්න සළකා බැලිය හැකි වනු පිණිස, ඔවුන්ගේ ලියාපදිංචි පොත්, දැනට ඔවුන් දෙපාර්තමේන්තුවෙහි කරන වැඩ, සහ එක් එක් ලොරියේ ඉඩ ප්‍රමාණයන් ඒවායේ ලියාපදිංචි අංකයන්ද සහිතව තමා සතුව ඇති ලොරි ප්‍රමාණය ආදිය පිළිබඳ ප්‍රකාශනයක් වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කරනු ලැබීමට ප්‍රථම රු 50 ක තැන්පත් මුදලක් ඉහත සඳහන් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයක තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩර් සම්බන්ධයෙන් වැඩි දුරටත් විස්තර අවශ්‍ය වෙතොත් මුලතිවු උපකොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාල වේලාවන් තුළදී ලබා ගත හැක.

කේ. ෂන්මුගරාජා,
වාරිමාර්ග ඉංජිනේරු,
මුලතිවු-උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
ඔඩ්ඩුසුඩ්ඩාන්,

1–286—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

අත්සන් කළ පසු මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රය පිළිගන්නා ලද බව දන්වූ දින සිට දින දහයක් ඇතුලත ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොත්‍රාත් කරුවන්ගේ නාම ලේඛණයට ඇතුලත් කිරීමටද හේතුවේ. එහෙත් එයින් රජයට ඔහුගෙන් අයවිය යුතු වෙනත් මුදලක් ඇතොත් එම අයකර ගැනීම්වලට බාධාවක් ඇති නොවේ. ගොවිපල කළමනාකරු විසින් නියම කරණ ලද් දිනයක වැඩ ආරම්භ කර, අදල දිනයට වැඩය නිමකර දිය යුතුයි. එසේ නොකරන්නාවූ ටෙන්ඩර්කරුවන්ට ගිවිසුම් පත්‍රයෙහි සඳහන්වන අලාභය ගෙවීමටද සිදුවේ.

5. ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරණ විට පැමිණ සිටීමට ඔවුන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් ඉහතින් දක්වා ඇති දින එකී වේලාවට යාපනයේ කෘෂිකර්ම නිළධාරි (ගො.පා.හා.නි.) තැනගේ කාය්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ.

6. පිළිගත් පෝර්මයෙහි (දෙපිටපතකින් යුතුව) ඉදිරිපත් නොකරණ ලද හෝ එහි සඳහන් කොන්දේසි වලට සම්පූර්ණයෙන්ම එකඟ නොවන්නා වූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණ හා මිළ ගණන් තීන්තෙන් පැහැදිළි ලෙස සටහන් කළ යුතු අතර, සියළුම වෙනස් කිරීම් වලට ටෙන්ඩර්කරුගේ අත්සන යොද සහතික කළයුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ නම සහ ලිපිනයන් සම්පූර්ණ ලෙස පැහැදිලි අකුරින් සටහන්කර තිබිය යුතුය.

8. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරණ ලදුව පිළිගනු ලැබුවාවූ වැඩ කොටස්වල මුලු වටිනාකමින් 5% ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට සිදුවේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටුකළ පසුය. පිළිගත් ටෙන්ඩරකරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුව හොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛණයෙහි එම ටෙන්ඩර් කරුගේ නමද ඇතුළත් කරණවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට අලවන මුද්දර සඳහා තම අතින් වියදම් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදු වේ.

10. අසතුටුදායක වැඩ කටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ, අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේය. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුගේ වියදමින් එම වැඩ සම්පූර්ණකර ගැණීම සඳහා වෙනත් විධි විධාන යොද ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේය.

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම .ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ, ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළගැනීමේ අයිතිය අයිතිය රජය සතු වේ.

12. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට සති තුනක් තුළ භාර ගැණීම සඳහා තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර්කරුවන්ට සිදුවේ.

13. මේ කොන්ත්‍රාක්තුව යටතේ වූ වැඩ කරවා ගැණීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත් කරු මෙයින් එකඟවන අතර ඔවුහු පමණක් එසේ නියුක්ත කරණු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙණ ප්‍රදේශයේ සිටින අයගෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිතව ලියවිල්ලකින් එකී නිළ ධාරියා විසින් අනුමත කරණ ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා ‘‘ ලාංකික ’’ යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රට වැසියෙකු බව අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධ යෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම, රෙගුලාසි වලට අනුකුලවූද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු කෙරෙහි එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛණ පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිළධාරියෙකුට ඒවා පරීක්ෂාකර බැලීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන්කර ඇති ලිපිනයකට තැපැලෙන් යැව්ව හොත් හෝ ඔහු අතටම භාර දුන්නා සේ සළකනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19වෙනි කම්කරු වන්දි ආඥපනතෙහි (117වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. කිසියම් සේවකයෙකු සේවයේ යෙදීමට අහිතකර යයි රජය සලකණු ලබන විටක හා කිසියම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතුවේ.

17. තනි වශයෙන් හෝ වෙනත් අයෙකුගේ නමක් සමඟ රජයේ, කොන්ත්‍රාත්තු පැහැර හරිණ ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛණයෙහි නම් සඳහන් කිසිවෙකු සමඟ හෝ තමාට සෑහේයයි හැඟී යන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධවන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. එකී එකී ගොවිපලවල කළමනාකරුවන්ගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගත හැක.

පී. ටී. ජිනේන්ද්‍රදස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

69.12.31 වැනි දින,
පේරාදෙණියේ දීය.

1–251/2—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### රජයේ ගොවිපළවලට වතුර පොම්ප දෙකක් හා ද්‍රව ඉසිනයක් සැයයීම හා ගෙනවිත් භාරදීම

යාපනයේ කෘෂිකර්ම (ගොවිපාලන හා නිෂ්පාදන) කාය්‍යාලයේ කෘෂිකර්ම නිලධාරි විසින් කිලිනොච්චි සහ වවුනියා ගොවිපළවලට වතුර පොම්ප දෙකක් සැපයීම හා ගෙනවිත් භාරදීම, මුරුන්කන් ගොවිපළට ද්‍රව ඉසිනයක් සැපයීම හා ගෙනවිත් භාරදීම සඳහා 1970.1.28 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාය්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක රුපියල් 10 ක් කෘෂි කර්ම නිලධාරි (ගො. පා. හා. නි.) නමින් තැන්පත් කළ බවට කුවිතාන්සියක් යාපනයේ කෘෂිකර්ම කාය්‍යාලයේ කෘෂිකර්ම නිලධාරී (ගො. පා. හා. නි.) වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින, දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

වැඩි විස්තර සඳහා මෙම ගැසට් පතේ පළවී ඇති ඉංග්‍රීසි දන්වීම බලන්න.

පී. ටී. ජිනේන්ද්‍රදස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

පේරාදෙණියේ දී ය,
1969.12.19 වැනි දින.

1–251/3—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි ඉදි කිරීම

මෙහි පහත සඳහන් ගණයන් යටතේ ඇති ගොඩනැගිලි ඉදි කිරීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 පෙබරවාරි මස 16 වැනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. එක් එක් ගණයන් යටතේ ඇති ගොඩනැගිලි සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු අතර එක් ගණයේ ගොඩනැගිලි වෙනුවෙන් හෝ ගණයන් කිහිපයක් වෙනුවෙන් හෝ ටෙන්ඩර් කිරීමට අවකාශ ඇත.

(අ) 5බී වර්ගයේ නිවාස 1 ක්, 3බී වර්ගයේ නිවාස 1 ක්—නුවරඑළිය ;

(ආ) 3ඒ වර්ගයේ නිවාස 2 ක්—නුවරඑළිය ;

(ඉ) 3බී වර්ගයේ නිවාස 1 ක්, 4බී වර්ගයේ නිවාස 1—කෘෂිකර්ම පාඨශාලාව, කුණ්ඩසාලය ;

(ඊ) 3බී වර්ගයේ නිවාස 1 ක්—ගොවිපළ මහඉලුප්පල්ලම ;

(උ) 3බී වර්ගයේ නිවාස 1 ක්—ගොවිපළ නාලන්ද.

2. කොළඹ-5, නාරාහේන්පිට, පළතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදේශක ඉංජිනේරුතැනගෙන් ලබාගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙළ කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන් විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැකිය.

3. සෑම ටෙන්ඩර් ඉල්ලුම්කරුවෙකුම (අ) ගණය යටතේ ඇති ගොඩනැගිලි සඳහා රු. 1,00,000 කටද, (ආ) සහ (ඉ) ගණය වෙනුවෙන් රු. 75,000 කටද, (ඊ) සහ (උ) ගණයන් වෙනුවෙන් රු. 35,000 කටද නොඅඩු කොන්ත්‍රාත් භාර ගැනීමට ටෙන්ඩර් කරුවන් වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වූ අය විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970.2.1 දින ප. ව. 4 දක්වා ටෙන්ඩර් පත් ලබා ගත හැකිය.

(අ) 3 ඡෙදයේ සඳහන් අයුරු ලියා පදිංචි වී ඇති බව ඔප්පු කිරීම.

(ආ) (අ) සිට (ඉ) දක්වා ගොඩනැගිලි සඳහා එක් ගණයකට රු. 100 බැගින්ද, (ඊ) සිට (උ) දක්වා එක් ගණයකට රු. 50 බැගින්ද, ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පළතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ-5.
1969. 12. 31.

1–226—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන නිලධාරී—කොළඹ

1969-70 වර්ෂයේ දෙවන භාගයට ගොඩනැගිලි තැනීමේ ද්‍රව්‍ය සැපයීම සඳහා පහත සඳහන් කොට්ඨාශයන් වෙනුවෙන් ටෙන්ඩර් මා විසින් කැඳවනු ලැබේ :—

(අ) කළුතර දිස්ත්‍රික්කයේ හැඩිගල්ල, වරතල්ගොඩ, ඉහල හෙවැස්ස, පැලවත්ත පාලම් අංශය, පැලවත්ත මාර්ග තැනීමේ අංශය සහ කෙලින්කන්ද.

(ආ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනාඔය, විල්ගම දෙමටාව, කළුගල්ල, වෙල්ලන්ගිරිය.

(ඇ) රත්නපුර දිස්ත්‍රික්කයේ අයගම, දෙල්ගොඩ, කරවිට, කුකුලේගම, මඩලගම සහ වරතල්ගොඩ.

(ඈ) කොළඹ දිස්ත්‍රික්කයේ කිරුළපන මධ්‍යම කාර්මික හල සහ ගබඩාව, කොළඹ 6, කොලොන්නාව වැඩ බිම, රත්මලාන වැඩ බිම, ප්‍රධාන කාර්යාලය දිගු කිරීමේ අංශය, කොළඹ 1, ජාතික ශ්‍රමදාන අංශය, අංක 120, ඇල්ස්ටන් පෙදෙස, කොළඹ 2.

(ඉ) පුත්තලම් දිස්ත්‍රික්කය විල්පොත.

කොළඹ 2, ඇල්ස්ටන් පෙදෙසේ කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1970 පෙබරවාරි මස 2 වැනි දින පෙරවරු 10 දක්වා 1969-70 මුදල් වර්ෂයේ දෙවන භාගය සඳහා පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සැපයීමේ ටෙන්ඩර්පත් භාරගනු ලැබේ :—

(1) වියන ලද ජෝඩු පොල්අතු (අඩි 7 ක් දික්වූද, අඟල් 14 ක් පළල වූද ජෝඩු පොල්අතු 1,000ක මිල.)
(2) අලුහුණු බුසල් 1 (එකක් රු. 44කට නොඅඩු බර තිබිය යුතුය) බුසලක මිල.
(3) තම්බාපු හුණු බුසලක මිල.
(4) කළුගල් 4×6" කියුබ් එකක මිල.
(5) කළුගල් 6×9" කියුබ් එකක මිල.
(6) තලාපුගල් 2" කියුබ් එකක මිල.
(7) තලාපු ගල් 1½" කියුබ් එකක මිල.
(8) තලාපු ගල් 1" කියුබ් එකක මිල.
(9) තලාපු ගල් ¾" කියුබ් එකක මිල.
(10) තලාපු ගල් ½" කියුබ් එකක මිල.
(11) පිලිස්සූ ගඩොල්—පිළිගත් ප්‍රමාණය 4½"×2¾"×8¼"—1,000 ක මිල.
(12) ගං වැලි කියුබ් එකක මිල.

2. කරුණාකර සපයන අත්දම් සහ වැඩ බිම් කරා ගෙනවිත් නියමිත අයුරු අසුරා තැන්පත් කිරීම සඳහා වෙන් වෙන්ව මිල ගණන් සඳහන් කළ යුතුය.

ටෙන්ඩර්කරුවෝ සපයන ලද ද්‍රව්‍ය සඳහා දුර ප්‍රමාණය හා සපයන ආකාරය ටෙන්ඩර් ෆෝර්මයේ සඳහන් කළ යුතුය.

(අ) ෆෝරතුවෙන්, ගල්වලෙන්, වත්තෙන් (දෙපාර්තමේන්තු ලොරි යා යුතු ස්ථාන කලින් පෙන්නුම් කළ යුතුය.)

(ආ) කොන්ත්‍රාත්කරු විසින් වැඩ බිමට ගෙනවුත් භාරදීම ඔහුගේ වාහන වලින් (පැටවීම, බෑම සහ නියමිත අයුරු ඇසිරීම ඇතුලත්ව).

3. පොල්අතු සහ හුණු සැපයීම සම්බන්ධයෙන් හැර අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන් එක් ව්‍යාපාරයක් සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50ක් බැගින්ද, පොල්අතු සහ හුණු වෙනුවෙන් එක් එක් දිස්ත්‍රික්කයන් වෙනුවෙන් රු. 50ක් බැගින්ද තැන්පත් කර ලබාගත් රිසිට් පත් ටෙන්ඩර් අයදුම් ආකෘති ලබාගැනීමට ප්‍රථම මා වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් අයදුම් ආකෘති 1970 පෙබරවාරි මස 1 වෙනි දින පස්වරු 3 දක්වා මාගේ කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ.

4. සෑම ටෙන්ඩර් අයදුම්කරුවෙක්ම ඔහුගේ නම සහ ලිපිනය ඉතා පැහැදිලිව සඳහන් කළ යුතුය. හුණු සහ පොල්අතු වෙනුවෙන් දිස්ත්‍රික්ක වශයෙන් සහ අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන් සෑම ව්‍යාපාරයකටම පිටපත් දෙක බැගින් පිළියෙල කළ යුතුය. සියළුම ටෙන්ඩර් අයදුම්පත් ලියාපදිංචි කරන ලද තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. කවරයෙහි වම්පස උඩ කෙලවරෙහි "කොළඹ ඉඩම් සංවර්ධන කොට්ඨාශයට ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්" යනුවෙන් ඉතා පැහැදිලිව සටහන් කල යුතුය.

කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරී,
කොළඹ ඉඩම් සංවර්ධන කාර්යාලය,
අංක 120, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2.

නැතහොත් කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරීගේ කාර්යාලයෙහි ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. 1970 පෙබරවාරි මස දෙවන දින පෙරවරු 10.15ට පසු රෙජිස්ටර් තැපෑලෙන් ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරන අතර ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කරනු නොලැබේ.

5. සාර්ථකවූ ටෙන්ඩර්කරු ඒ බව දන්වීමෙන් සති දෙකක් ඇතුලත ද්‍රව්‍ය භාරදීමට හැකිවිය යුතුය. යමෙකුට එසේ කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ නම කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් වන්නේය.

6. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම් 1970 පෙබරවාරි මස 6 වෙනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේදී පෙනී සිටිය හැක.

7. ටෙන්ඩර් ගණනාවක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හෝ ටෙන්ඩරයක කොටසක් භාරගැනීමේ අයිතිය හෝ විශේෂ විස්තරයකට අනුකූල නොවූ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ඉඩම් සංවර්ධන නිලධාරි සතුය.

එම්. අයි. එම්. නාලීර්,
කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරී.

1969 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ 2 හි පිහිටි ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක පෙදෙසේ,
අංක 120 දරන ස්ථානයෙහි
කොළඹ ඉඩම් සංවර්ධන කාර්යාලයේ දීය.

1–311—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—වර්ෂ 1970 පෙබරවාරි 1 වන ද සිට 1970 දෙසැම්බර් 31 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම සහ රත්නපුරය යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තරය.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් හෝ ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී තැන, වවුනියාව " කියා එවිය යුතුයි. සීල් කරණ ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන් ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම, ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව ප්‍රාදේශීය ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වූවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීමෙන් හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතුව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ " බී " උපලේඛනයෙහි සඳහන් කර ඇති ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම් කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනසක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ හෝ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන් ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

පො. රත්නසභාපති,
සෞඛ්‍ය සේවා අධිකාරී, වවුනියාව.

1969 දෙසැම්බර් මස 31 වැනි දින,
වවුනියාව,
සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය.

### උප ලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | (3) ඇප තැන්පත් මුදල | (4) ටෙන්ඩර් අවසාන වන දිනය සහ වේලාව | (5) අවශ්‍ය ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන් — A බත් | B මස් | C කරවල | D එළවළු | රෝගීන් — E බත් | F මස් | G කරවල | H එළවළු | I කිරි ආහාර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් | රුපියල් | | | | | | | | | | |
| වවුනියා කොට්ඨාශය : | | | | | | | | | | | | |
| ග්‍රා.රෝ. චෙඩ්ඩිකුලම් ... | 100... | 800 | | 670... | — ... | 340... | 1,320... | 750... | — ... | 360... | 1,440... | — |
| ග්‍රා.රෝ. ජේසාලේ ... | 100... | 600 | 70.1.24 | 660... | — ... | 310... | 1,260... | 580... | — ... | 280... | 1,100... | — |
| ග්‍රා.රෝ. සිලාවතුරෙයි ... | 100... | 600 | පෙ.ව. | 700... | — ... | 690... | 1,070... | 1,100... | — ... | 1,100... | 1,550... | — |
| මා.නි. මාන්කුලම් ... | 100... | 400 | 10 | 230... | — ... | 460... | 930... | 150... | — ... | 280... | 590... | — |
| මා.නි. පුවර්සන්කුලම් ... | 100... | 400 | | 410... | — ... | 210... | 810... | 340... | — ... | 170... | 710... | — |
| මා.නි. පාවක්කුලම් ... | 100... | 400 | | 370... | — ... | 180... | 740... | 90... | — ... | 50... | 180... | — |
| ග්‍රා.රෝ. පුතුකුඩිරිප්පු ... | 100... | 600 | | 500... | — ... | 450... | 1,260... | 910... | — ... | 970... | 2,440... | — |

## ලංකා ගමනාගමන මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීමයි

කොළඹ 5, කිරුළ පාරේ නො. 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති තැන විසින් පහත සඳහන් සැපයීම් සඳහා පෙබරවාරි මස 9 වැනි දින පෙ. ව. 10 වන තෙක් සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1. දව සැපයීම.
2. රාක්ක සැපයීම.

ටෙන්ඩර් පත්‍ර නියමිත ෆෝර්ම කොලවල ලියා අනුපිටපතකින් ද යුක්තකොට එවිය යුතුයි. එම ෆෝර්ම කොළ ටෙන්ඩර් විවෘත කරන ඉහත සඳහන් දිනයට පෙරදින දවල් 12 වනතෙක් මගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. මෙම ෆෝර්ම ලබා ගැනීමට කොළඹ 5, කිරුළ පාරේ, අංක : 200 වෙනි ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත ටෙන්ඩර් සඳහා මුදලින් රු. 100 ක් තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

1–400—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීමේ වැඩ සඳහා 1970 ජනවාරි 23 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ:—

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල රු. | ශ. |
|---|---|---|
| 1. බෝක්කු සමග දේවහුව ජනපදයේ ප්‍රවේශ මාර්ගයේ පළමුවැනි සැතැප්ම ඉදිකිරීම ... | 30,000 | 0 |
| 2. බෝක්කු සමග දේවහුව ජනපදයේ ප්‍රවේශ මාර්ගයේ දෙවැනි සැතැප්ම ඉදිකිරීම ... | 30,000 | 0 |
| 3. තන්තිරිමාලේ පාරේ දෙවැනි සැතැප්ම ඉදිකිරීම ... ... | 30,000 | 0 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචිවී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිතිවලට සහ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ටද 1970 ජනවාරි මස 21 දින දවල් 12 තෙක් අනුරාධපුර කච්චේරියේදී ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝර්ම අපේක්ෂකයන් විසින් අනුරාධපුර කච්චේරියේ වැඩය වෙනුවෙන් රුපියල් 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් අනුරාධපුර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත්කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිති ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය චෙක්පත් මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් ෆෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩරය බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ කෙළවරේ, වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් ෆෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, කොළඹ, ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ අංක 357 දරන කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

5. 1970 ජනවාරි 23 වැනි දින පස්වරු 2.30 ට ඉහතකී අංක 357 දරන කාමරයේදී ටෙන්ඩර් ෆෝර්ම විවෘත කරනු ලැබේ.

6. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔවුන් පමණක් එසේ නියුක්ත කරනු ලැබිය යුතුය. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

7. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගුවීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින්, එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව, ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

9. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යෙදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද කම්කරුවන්ට වේතන ගෙවීම් සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ විය යුතුයි.

10. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චෙක්රෝල් පොත්, පෙරෙව්වු පොත් සහ අනිකුත් ලිපිලේඛන පරීක්ෂාකර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

11. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම්පතක් මගින් අනුරාධපුර දිසාපතිගෙන් ලබාගත හැකිය.

ජී. පී. ඉලංගසිංහ,
අනුරාධපුර දිසාපති වෙනුවට.

1969 දෙසැම්බර් 20 වැනි දින,
අනුරාධපුර දිසාපති කාර්යාලයේදීය.

1–287—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—වර්ෂ 1970 පෙබරවාරි 1 වනද සිට 1970 දෙසැම්බර් 31 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික යන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාර ගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—එම උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ චේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(2) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම් මට හෝ තමා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයේහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙතට '' කියා එවිය යුතුයි. සිල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම්තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණ.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1969 දෙසැම්බර් මස 26 වැනි දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දීය.

## උපලේඛනය

| | (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයින්ට: මාළු | මස් | කරවල | එළවළු | නොගෙවන රෝගීන්ට: මාළු | මස් | කරවල | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | | | | | | | | | |
| 1. | අත්තනකඩවල ග්‍රා. රෝ. ... | 100... | 300 | | 276... | 275... | 275... | 1,120... | 300... | 320... | 310... | 1,250 |
| 2. | ඩී. ඕ. පී. 400 ග්‍රා. රෝ. ... | 100... | 500 | | 400... | 400... | 400... | 1,600... | 1,100... | 1,120... | 1,100... | 4,325 |
| 3. | යටවත්ත මා. නි. ... | 100... | 400 | | 180... | 175... | 175... | 700... | 460... | 450... | 450... | 1,775 |
| 4. | ගිරිතලේ මා. නි. ... | 100... | 400 | 70.2.26 වැනි | 235... | 100... | 450... | 875... | 650... | 260... | 1,200... | 2,400 |
| 5. | මනම්පිටිය මා. නි. ... | 100... | 300 | දින පෙරවරු | 90... | — ... | 120... | 400... | 225... | — ... | 300... | 1,050 |
| 6. | උතුරු මාතලේ මා. නි. ... | 100... | 400 | 10ට | 85... | 90... | 90... | 360... | 575... | 575... | 550... | 2,175 |
| 7. | ඕවිලිකන්ද මා. නි. ... | 100... | 400 | | 325... | 320... | 320... | 1,270... | 475... | 460... | 460... | 1,800 |
| 8. | ඉලුක්කුඹුර මා. නි. ... | 100... | 400 | | 275... | 275... | 550... | 90... | 160... | 140... | 300... | 475 |
| 9. | දේවහුව මා. නි. ... | 100... | 400 | | 250... | 250... | 250... | 950... | 450... | 475... | 460... | 1,790 |
| 10. | මැදිරිගිරිය මා. නි. ... | 100... | 300 | | 200... | — ... | 600... | 900... | 250... | — ... | 700... | 1,000 |

1-239/1—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව නොපිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—වර්ෂ 1970 පෙබරවාරි 1 වනදා සිට 1970 සැප්තැම්බර් 30 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව නොපිසූ ආහාර සැපයීම සඳහා ලාංකික යන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාර ගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—එම උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(2) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම් මට හෝ තමා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡේදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී වෙතට " කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම්තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කළින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණ.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුයි.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1969 දෙසැම්බර් මස 27 වැනි දින,
මාතලේ, සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

## උප ලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයන්ට | | | | (5) ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — නොගෙවන රෝගීන්ට | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මස් | මාළු | කරවල | එළවළු | මස් | මාළු | කරවල | එළවළු |
| පල්ලේගම ගෘහ රෝහල | 100 | 800 | 70.2.26 වැනි දින පෙ.ව. 10ට | — | 500 | 1,000 | 2,000 | — | 1,500 | 3,000 | 5,500 |

1–239/2—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—වර්ෂ 1970 පෙබරවාරි 1 වනද සිට 1970 සැප්තැම්බර් 30 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාර ගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—එම උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(2) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම් මට හෝ තමා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙතට " කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම්තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කළින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවති නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුයි.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1969 දෙසැම්බර් මස 27 වැනි දින,
මාතලේ, සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

## උප ලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් ඇප ගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයන්ට: මාළු | සේවකයන්ට: මස් | සේවකයන්ට: කරවල | සේවකයන්ට: එළවළු | නොගෙවන රෝගීන්ට: මාළු | නොගෙවන රෝගීන්ට: මස් | නොගෙවන රෝගීන්ට: කරවල | නොගෙවන රෝගීන්ට: එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. නාලන්ද පර්යන්ත ඒකකය ... | 100... | 800... | 70.2.26 දින පෙ.ව. 10ට | 250... | 250... | 250... | 250... | 1,000... | 1,050... | 1,000... | 5,000 |

1–239/3—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## ජාතික කිරි ව්‍යාපාරය—පිටි කිරි සහ සීනි එහා මෙහා ගෙන යාම

ටෙන්ඩර ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා—වර්ෂ 1970 පෙබරවාරි 1 වෙනිද සිට 1970 සැප්තැම්බර් මස 30 වැනිද දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුල මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට, පිටි කිරි දුම්රිය ස්ථානවල (සෞඛ්‍ය කාර්යාලවල) සීනි, සමුපකාර තොග ගබඩාවල සිට සෞඛ්‍ය කාර්යාල වලටද, සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලටද ගෙන යාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර මාතලේ සෞඛ්‍ය අධිකාරිතැන විසින් භාරගනු ලැබේ.

2. (අ) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

(ආ) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍ය්‍යාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, බදුල්ල, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, කෑගල්ල, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍ය්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොකරන අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූවිට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු පිටිකිරි සහ සීනි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 3 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, මාතලේ'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවන් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍ය්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ කාර්‍ය්‍යාලයේ ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරන ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන ඡෙදයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීමට හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉක්මවන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතු ද වන්නේ ය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැන ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් මගින් මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරීගෙන් විමසන්න.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍යසේවා අධිකාරී.

1969 දෙසැම්බර් මස 27 වැනි දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍ය්‍යාලයේ දීය.

**උප ලේඛනය**

| සේවය | ප්‍රදේශය | දෙමසකට වරක් ගෙනයන ප්‍රමාණය: පිටිකිරි හො. | දෙමසකට වරක් ගෙනයන ප්‍රමාණය: සීනි හො. | විවෘත කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට පිටි කිරිද, මාතලේ සමුපකාර බඩු ගබඩාවේ සිට සීනි ද, මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්‍ය්‍යාලයට සහ මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්‍ය්‍යාලයේ සිට මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... ... ... | මාතලේ ... | 21 ... | 8½ | 70. 2. 26 පූ. භා. 10ට |
| කදුරවෙල දුම්රිය ස්ථානයේ සිට පිටි කිරිද, තමන්කඩුව සමුපකාර සංගමයේ සිට සීනි ද, හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්‍ය්‍යාලයට සහ හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කාර්‍ය්‍යාලයේ සිට හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... ... ... | හිඟුරක්ගොඩ | 13½ ... | 6 | |
| කැකිරාවේ දුම්රිය ස්ථානයේ සිට පිටි කිරි ද, දඹුල්ල සමුපකාර සංගමයේ සිට සීනි ද, දඹුල්ලේ සෞඛ්‍ය කාර්‍ය්‍යාලයට සහ දඹුල්ලේ සෞඛ්‍ය කාර්‍ය්‍යාලයේ සිට දඹුල්ලේ සෞඛ්‍ය කාර්‍ය්‍යාලය භාර නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... | දඹුල්ල ... | 22½ ... | 8½ | |
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට පිටි කිරි ද, මාතලේ සමුපකාර සංගමයේ සිට සීනි ද, රත්තොට සෞඛ්‍ය කාර්‍ය්‍යාලයට සහ රත්තොට සෞඛ්‍ය කාර්‍ය්‍යාලයේ සිට රත්තොට සෞඛ්‍ය කාර්‍ය්‍යාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... | රත්තොට ... | 30 ... | 11½ | |

